**ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1. තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.3,611,189 ක් ලෙස හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ රු.3,684,435 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය නොවන වත්කම්වලට අදාළව එහි ආරම්භක ශේෂයට ගැලපුම් කරන ලද ජ'නල් සටහනක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඒසීඒ - 06 ආකෘතියෙහි මූලධන වත්කම් අත්පත්කර ගැනීමක් ලෙස වැරදියට සටහන් කිරීම නිසා මෙම වෙනස ඇති විය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදයට අදාල මාර්ගෝපදේශ අංක 06 හි 3.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පුනරාවර්ථන වැය විෂයයන් 13 ක රු.27,619,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් රු.8,330,635 ක් ඉතිරිව තිබූ අතර එහි එක් එක් වැය විෂයයන් හි ඉතිරිවීම් සියයට 16 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. | පහත සඳහන් හේතු මත පුනරාවර්ථන ප්‍රතිපාදන ඉතිරිවී ඇත.<br>(i) කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මාස 04 කට ආසන්න කාලයක් සීමිත නිලධාරීන් ප්‍රමාණයක් කාර්යාලයට කැඳවීම, නිලධාරීන්ට ක්ෂේත්‍ර රාජකාරීවල යෙදීම සීමා | වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

කිරීම, විදේශීය ගමන් සිදුකළ නොහැකි වීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් හා විවිධ වැඩසටහන් සඳහා සහභාගි නොවීම, රාජකාරී කටයුතු සඳහා වාහන භාවිතය අවම වීම.

(ii) රියදුරු නිලධාරීන් දෙදෙනෙකු වෙත නිල ඇඳුම් සඳහා ගෙවීම් කිරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ හෙයින් එය වෙනත් වැය විෂයකින් ගෙවීම් සිදු කළ ද එම වැය විෂයට ප්‍රතිපාදන මාරු කිරීම මගහැරීම.

(iii) ලද ප්‍රතිපාදන ප්‍රමාණය කාර්යය සාධන වාර්තාව මුද්‍රණය කිරීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙනත් වැය විෂයකින් මීට අදාළ ගෙවීම් සිදුකිරිම, මාස 04 ක පමණ කාලයක් කාර්යාලය අලුත්වැඩියා කටයුතු සැලසුම් කල පරිදි සිදුකර ගැනීමට නොහැකි වීම, ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාලය වසා දැමීම හා තැපැල් කටයුතු ක්‍රමවත්ව සිදු නොවීම, මාස 04 ක් පමණ ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල වසා දැමීම, මාස 08 ක පමණ කාලයක් පිරිසිදු කිරීමේ කාර්යමණ්ඩලය වාර්තා නොකිරිම.

(iv) නිලධාරීන්ගේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ ඉල්ලීම අවම වීම.

(v) ප්‍රවාහන වැය විෂයෙහි වියදම් අවම වීම.

| | | |
|---|---|---|
| (ආ) මූලධන වැය විෂයයන් 04 ක රු.7,232,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් රු.3,606,792 ක් ඉතිරිව තිබූ අතර එහි එක් එක් වැය විෂයයන් හි ඉතිරිවීම් සියයට 42 සිට සියයට 80 ක් දක්වා වූ පරාසයක පැවතුණි. | පහත සඳහන් හේතු මත මූලධන ප්‍රතිපාදන ඉතිරිවී ඇත.<br>(i) ප්‍රාදේශිය කාර්යාල 02 ක් අළුත්වැඩියාව සඳහා අදාළ මහාධිකරණ වෙත ප්‍රතිපාදන පැවරුවද කොරෝනා වසංගත තත්ත්වය නිසා එම වැඩි දියුණුකිරීම් කටයුතු සිදු කළ නොහැකි වීම.<br>(ii) පරිගණක යන්ත්‍ර සඳහා ප්‍රතිවෛරස් මෘදුකාංග ලබා ගැනීම සඳහා වැය කළ නමුත් වෙනත් වැඩි දියුණුකිරීම් නොමැති වීම.<br>(iii) වාහන හොඳ තත්ත්වයේ පැවතිම.<br>(iv) නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා මතින් මිදී යහපත් පුරවැසියන් ලෙස සමාජගත වන ආඥාලාභීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා වූ කාර්යයන් අවලංගු කිරීමට සිදු වීම. | වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විධිමත් විනය පරීක්ෂණ නොපැවැත්වීම හේතුවෙන් වසර 09 කට අධික කාලයක් පවතින වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.131,020 ක ණය ශේෂය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | වැඩතහනමට ලක්ව ඇති ජේ.ජී.පී.පී.වීරසිංහ මයා වෙනුවෙන් පැවැත්වෙන විධිමත් විනය පරීක්ෂණය තවදුරටත් පැවැත්වෙන අතර ඔහුගෙන් අයවිය යුතුව ඇති රු.131,020 ක ණය ශේෂය අයකර ගැනීම සඳහා ඩීසීබීසී/ඒසීසී/07/04 හා 2020 අගෝස්තු 27 දිනැති ලිපිය අදාළ ඇපකරු වන ඩී.විරිත්තමුල්ල මහත්මිය වෙත යවා ඇති අතර ඇයගේ සේවා ස්ථානය වන ඇලපාත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශිය ලේකම් තුමා වෙතද ලිපි යොමු කර ඇත. නැවත සිහිකැඳවීමේ ලිපියක් 2021 අප්‍රේල් 05 දින යොමු කර ඇත. | අයවිය යුතු ණය අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික අයවැය චක්‍රලේඛ අංක 118 ප්‍රකාරව රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත හා පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.300,551 ක් අයකරගෙන නොතිබුණි. | 2020 වර්ෂය තුළ රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවෙත මාරු වී ගිය නිලධාරීන් තිදෙනාගෙන් අයවිය යුතුව තිබූ රු.186,676 ක මුදල අයකර ගැනීම සඳහා වැටුප් විස්තර අදාල ආයතන වෙත ලිපි යොමු කර ඇත. තවද 2020 වර්ෂය තුළ පළාත් රාජ්‍ය සේවයේ, ගුරු සේවය වෙත පත්වීම් ලැබ ගිය එම්.කේ.එම්.රස්මි මහතාගෙන් අයවිය යුතුව තිබූ රු.113,875 ක මුදල කඩිනමින් නිරවුල් කරන ලෙස ඉල්ලා අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ලිපි යොමු කර ඇත. | අයවැය චක්‍ර ලේඛ අංක 118 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදයට අදාල මාර්ගෝපදේශ අංක 06 හි 6 ඡේදය ප්‍රකාරව, මුදල් රෙගුලාසි 94(2) හා (3) යටතට නොගැනෙන බැදීමක් වන රු.202,164 ක දේශීය ගමන් වියදම් බැදීම් තුළ ඇතුළත් කර තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදයට අදාළ මාර්ගෝපදේශ අංක 06 හි 6 ඡේදය ප්‍රකාරව ඉදිරි කටයුතු කරමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2) | කාර්යය නිම කළ විගස ලබාගත් අත්තිකාරම් පියවිය යුතු වුවත්, අවස්ථා 43 කදී ලබා ගෙනතිබූ රු.759,470 ක අත්තිකාරම් දින 13 සිට දින 227 කාලයක් ප්‍රමාද කර පියවා තිබුණි. | 2020 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යයන් සඳහා අවස්ථා 165 කදී රු.1,530,620 ක මුදලක් තත්කාර්ය අතුරු අග්‍රිමය වෙනුවෙන් මුදල් ලබා දී ඇත. එසේ ලබා දෙන ලද අත්තිකාරම් වලින් කාර්යය නිම කළ විගසම පියවීමට නොහැකි වී ඇති අවස්ථා 43 කට අදාල රු.759,470 ක අතුරු අග්‍රිමය පිළිබඳ කරුණු සඳහන් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.5** **බැංකු ගිණුම් මෙහෙයවීම**

-------------------------------

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අංක 100159027420 දරන බැංකු ගිණුමෙහි 2020 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ දින සිට බැංකුවට ඉදිරිපත් නොකරන ලද මාස 06 ඉක්මවූ රු.37,035 ක් වටිනා චෙක්පත් 29 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වෙනත් වර්ෂවලදී මාස 06 ක් ඉක්මවූ චෙක්පත් සඳහා මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර බැංකු සැසඳුම් නිරවුල් කිරීමට කටයුතු කර ඇති අතර, 2020 ඔක්තෝම්බර් මස නැවත කොවිඩ් 19 දෙවන රැල්ලේ ආරම්භයත් සමඟ මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව අනුගමනය කරනු ලැබූ පියවර අනුගමනය කිරීමට නොහැකි විය. මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව බැංකු සැසඳුම නිරවුල් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බවද දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව හඳුනා නොගත් රු.30,048 ක් වටිනා චෙක්පත් 16 ක් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 ඔක්තොම්බර් මස නැවත කොවිඩ් 19 දෙවන රැල්ලේ ආරම්භයත්, වරින් වර සිදු වූ ප්‍රදේශ හුදකලා කර තැබීම සහ ප්‍රාදේශිය කාර්යාල වසා තැබීම හේතුවෙන් දෙපාර්තමේන්තු ගිණුමට මුදල් බැර කරන ලද රිසිට්පත්වල පිටපත් නියමිත පරිදි ප්‍රධාන කාර්යාලයට නොලැබීමෙන් වෙන් වෙන් වශයෙන් ශේෂ හඳුනා ගැනීමේ ගැටලු මතුවිය. | හඳුනා නොගත් ශේෂ කඩිනමින් හඳුනාගෙන අදාල නිවැරදි කිරීම් කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1. මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පැල්මඩුල්ල හා කළුතර ප්‍රජා විශෝධන කාර්යාලය වැඩිදියුණු කිරීම සඳහා පිළිවෙලින් රු.922,896 ක් හා රු.679,810 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම කටයුතු ආරම්භ කර නොතිබුණි. | රත්නපුර මහාධිකරණය මඟින් ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කළද, අවම ලංසුකරු විසින් 2020 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරීමට නොහැකි බව දැන්වීම සහ දෙවන ලංසුකරුගේ ලංසුව අසම්පූර්ණව ඉදිරිපත් වීම යන කරුණු හේතුවෙන් රත්නපුර මහාධිකාරණයේ අංක රත්/මහාධි/ගණක/ප්‍රසම්පාදන/2020 හා 2020 දෙසැම්බර් 14 දිනැති ලිපියෙන් ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත නැවත පවරා ඇත. කළුතර මහාධිකරණය මඟින් ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කළ ද, කොවිඩ් 19 හේතුවෙන් අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් බාහිර පුද්ගලයන්ට අදාළ කාර්යයන් සඳහා ඇතුල්වීමට ඉඩදිය නොහැකි බව පානදුර මහේස්ත්‍රාත් අධිකරණය විසින් දැන්වීම මත අදාල අළුත්වැඩියාව සිදු නොවීම හේතුවෙන් කළුතර මහාධිකරණයේ අංක කළු/මහාධි/ගි/ප්‍රති.ඉල්ලීම්/2020 හා 2020 දෙසැම්බර් 10 දිනැති ලිපියෙන් ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත නැවත පවරා ඇත. | ප්‍රතිපාදන ලැබී ඇති ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 3.2. ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 4(2) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන ඇතුළත් ප්‍රසම්පාදන සැලැස්මක් හා එක් එක් ප්‍රසම්පාදන පියවරයන් ඇතුළත් කර විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු වුවද 2020 වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව වෙතින් ඉතා විශාල දීර්ඝ කාලීනව සිදු කළ යුතු ප්‍රසම්පාදන කටයුතු නොමැති බැවින් අදාළ වර්ෂයේ දී දෙපාර්තමේන්තුව වෙත වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කර ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.<br>තවද එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 4(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | පියවර දැක්වෙන විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් මේ වන විට සකස් කර නොමැති බවත්, ඉදිරි වර්ෂයේ සිට විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමටත් කටයුතු කරමි. | |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) වගන්තිය ප්‍රකාරව රු.3,307,159 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව විසින් රු.500,000 වඩා වැඩි භාණ්ඩ හෝ සේවා සඳහා තෝරා ගන්නා ලද සැපයුම්කරු හෝ ලංසුකරු සමඟ ප්‍රතිග්‍රහන ලිපියක් අනුව කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් නොකරනු ලබයි. මේ වන විට සැපයුම්කරු හෝ ලංසුකරු වෙත ප්‍රතිග්‍රහන ලිපිය සේ සලකා භාණ්ඩ හෝ සේවාවන් දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමේදී දෙපාර්තමේන්තුවේ කොන්දේසි ඇතුලත් විධිමත් ගිවිසුමක් ලෙස මිලදී ගැනීමේ ඇණවුමක් **(Purchase Order)** මඟින් සැපයුම්කරු හෝ ලංසුකරු සමඟ ගිවිසුමකට එළඹේ. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් මිල සැඳහුම් ක්‍රමය අනුව මිල ගණන් කැඳවීමේදී නිර්දේශිත ස්ථාවර ලංසු ලේඛන **(Standard Bidding Document – National Shopping Procedures)** අනුව ගිවිසුමක ආකෘතිපත් හඳුන්වා දී නොමැත. කෙසේ නමුත් ඉදිරියේදී දෙපාර්තමේන්තුව විසින් රු.500,000 වඩා වැඩි භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක්, තෘතිය මට්ටමේ පුරප්පාඩු 27 ක්, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 69 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 03 ක් ඇතුළුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 102 ක් විය. | 2021 අප්‍රේල් 01 දින සිට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් 201 ක් සමඟ අනුයුක්ත සේවක සංඛ්‍යාව 744 කි. සංවර්ධන නිලධාරී තනතුරු 354 ක් ඇති කිරීම සඳහා 2020 ඔක්තෝම්බර් 06 දිනැතිව මුදල් රෙගුලාසි 71 අයදුම්පත් ඉදිරිපත් කර ඇත. පුරප්පාඩුව පැවති ප්‍රජා විශෝධන නිලධාරී තනතුරු 15 න් නිලධාරීන් 10 ක්ද හා වැඩ පරීක්ෂක තනතුරු 21 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීම් මේ වන විට සිදු කර ඇත.<br>ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී තනතුරේ පුරප්පාඩු 10 පිරවීම සඳහා කටයුතු කරමින් පවතී. සංවර්ධන නිලධාරී තනතුරු 52 ක් පුරප්පාඩුව පැවති අතර, 2021 අප්‍රේල් 01 දින සිට නව නිලධාරීන් 201 දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ඇත.<br>ගණකාධිකාරී, භාෂා පරිවර්තක, පරිපාලන නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරී, කාර්යාල කාර්ය සහයක, රියදුරු තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කරන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් සිදු කර ඇත. | සුදුසු නිලධාරීන් පුරප්පාඩු සඳහා බඳවාගෙන එලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |